# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 11,727 — 1959 අප්‍රේල් 17 වැනි සිකුරාදා—17.4.1959

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)

## I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(එක් එක් කොටස වෙන වෙනම බැඳ තබා ගත හැකි වීම පිණිස පිටු අංක යොදා ඇත්තේ වෙන වෙනම එක් එක් කොටසට ගැලපෙන පරිද්දෙනි)



| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... | 953 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | — | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... | — |
| ටැන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | 955 | රට බීම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... | — |
| තීරණය කළ ටැන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... | — | වෙන්දේසි කිරීම පිළිබඳ දැන්වීම ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම ... ... | 964 | විවිධ දැන්වීම් ... ... ... | 964 |



## තනතුරු-ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ ජීවන දීමනාව යන මෙම දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන්හි දී, ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කායික සංවිධාන සංග්‍රහ රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධානවලට හෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේ ය.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් සවකීය මනාපය පරිදි තවත් සියයට 5ක් ද ඊට එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½කට සමාන වන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානයන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතට අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට, ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

4. **නවප්‍රවේශක නිලධාරීහු.**—(i) විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරු වලට පත් කරනු ලබන "නවප්‍රවේශක නිලධාරීන්" සම්බන්ධයෙන්, කිසියම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇති අවස්ථාවන්හිදී මිස, අන් හැම අවස්ථාවකදීම ආධුනික/පරීක්ෂා කාලය යථායෝග්‍ය පරිදි තුන් වර්ෂයක් වේ.

(ii) "නවප්‍රවේශක නිලධාරීන්" ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාවේ යෙදවීමත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමත් සඳහා දැනට පනවා ඇති ව්‍යවස්ථාවලට මෙන් ම මින් මතු පනවනු ලබන ව්‍යවස්ථාවලට ද අනුකූල ව ක්‍රියා කළ යුතු වේ.

(iii) (අ) මෙම නිලධාරීන් සවකීය ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාවක් ලබා ගත යුතුය.

(ආ) සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණතා පරීක්ෂණයකින් සමත් වීම, ආධුනික/පරීක්ෂා කාලය අවසන් වීමෙන් පසු එම නිලධාරීන්ගේ තනතුරු ස්ථිර කිරීම සඳහා අවශ්‍ය වන සුදුසුකම් අතුරින් එකක් වේ.

ආධුනික/පරීක්ෂා කාලය ඇතුළත සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණතාව සම්බන්ධයෙන් නියමිත වූ තත්ත්වයට එළඹීමට අසමත් වන අය තනතුරෙන් පහකරනු ලැබීමට ඉඩ තිබේ. එහෙත් "ඔවුන් රාජ්‍ය භාෂාව හැදෑරීමෙහි ලා අව්‍යාජ ප්‍රයත්නයක් දරා ඇතැ" යි ඔවුන් එම තනතුරුවලට පත් කළ බලධාරීන් විසින් පිළිගැණෙතොත්, එසේ තනතුරුවලින් පහ කිරීම ප්‍රමාද කිරීමට ඉඩ තිබේ. එබඳු වූ කිසියම් නිලධාරියකු නියමිත දිනයට පසු සෑහෙන කාල සීමාවක් ඇතුළත සිංහල භාෂා ප්‍රවීණතාව සම්බන්ධයෙන් පැවැත්වෙන පරීක්ෂණයකින් සමත් වුවහොත්, කලින් අසමත් වීම නිසා ඔහුට නැති වී ගිය ජ්‍යෙෂ්ඨත්වය නැවත ලබා දීම, එම කාර්යය පිළිබඳ නිසි බලධාරීහුගේ කැමැත්ත පරිදි සිදු වේ.

(iv) සිංහල මාධ්‍යයෙන් සුදුසු කම් ලබා රාජ්‍ය සේවාවට ඇතුළු වන නවප්‍රවේශක නිලධාරීහු සිංහල භාෂා ප්‍රවීණතා පරීක්ෂණයෙන් නිදහස් කරනු ලැබෙත්.

**සංලක්ෂ්‍යය.**—" නව ප්‍රවේශක නිලධාරීහු " යනුවෙන් මෙහි දී අදහස් කෙරෙනුයේ 1956 සැප්තැම්බර් 24 වැනිදා හෝ ඊට පසු ව හෝ රාජ්‍ය සේවාවේ තනතුරුවලට පත් කරනු ලැබුවා වූද, එසේම 1957 මැයි 23 වැනි දින නිකුත් කළ අංක 379 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 2 (ii) (ආ) සහ 2 (ii) (ඇ) දරන අනුච්ඡේදයන්ට අනුකූල ව ආදි ප්‍රවේශක නිලධාරීන් වශයෙන් නොසැලකෙන්නා වූද තැනැත්තෝ වෙත්.

**5. අවශ්‍ය සුදුසුකම්.**—තමා ලාංකිකයකු වූ බවට සෑහෙන සාක්ෂ්‍ය සෑම ඉල්ලුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතු ය. " ලාංකික " යනුවෙන් අදහස් කෙරෙනුයේ පරම්පරාවෙන් හෝ ලියා පදිංචි කරවා ගැනීමෙන් හෝ රටවැසියකු වූවෙකි.

**6. යුද්ධ සේවා අනුග්‍රහය.**—මෙම තනතුරු සඳහා අන්‍ය සෑම අයුරෙක ම සුදුසුකම් ලැබ සිටින්නා වූද, මහා රාජිනියන් වහන්සේගේ යුද හමුදාවන්හි යෙදී සිට සේවා මුක්ත වූද අයට හා සහාය ගිනි නිවන සේවාව, ගගන ප්‍රහාර නිවාරණ සේවාව, මහජනාරක්ෂක සේවාව යන මෙම සේවාවන්හි සම්පූර්ණ කාල සේවයෙහි යෙදී සිටි (සිය කැමැත්තෙන් ම සේවයෙන් අස් වූවන් හැර) සෑම කෙනකුට මද, ඔවුහු 1945 අගෝස්තු මස 15 වැනි දිනට පෙර එම හමුදාවන්ට බැඳී සතුටුදායක ලෙස නොකඩව සේවය කළෝ නම්, වයස පිළිබඳ සුදුසුකම් ලබා ගැනීම සඳහා පමණක්, ඉතා ඈතින් 1939 සැප්තැම්බර් 3 වැනි දිනත් ඉතා මෑතින් 1949 දෙසැම්බර 31 වැනි දිනත් යන මෙදතුර තමන් එසේ සේවයෙහි යෙදී සිටි කාලපරිච්ඡේදය තම වයසින් අඩු කර ගැනීමට ඉඩ දෙනු ලැබේ.

**7. වෙනත් අවශ්‍ය කරුණු.**—(i) දැනට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින අවශ්‍ය සුදුසුකම් ඇති නිලධාරීන් මෙම තනතුරුවලට ඉල්ලුම් පත් එවිය යුත්තේ සවකීය දෙපාර්තමේන්තුවල ප්‍රධානයන් මාර්ගයෙනි. රාජ්‍ය සේවාවේ සථිර තනතුරු දරන නිලධාරීන් විසින් එවන ලද ඉල්ලුම් පත් ඉදිරිපත් කිරීමේදී, ඒ ඒ දෙපාතීමේන්තු ප්‍රධානීහු, එම ඉල්ලුම් කරුවන් (තෝරාගනු ලැබුවහොත්) කාර්ය සංවිධාන සංග්‍රහයේ 109 වැනි පාලන රෙගුලාසියට අනුකූල ව ඔවුන්ගේ නිලවලින් මුදා හැරීමට තමන් සූදානම් ව සිටිත් ද, නැද්ද ' යි සඳහන් කොට එවිය යුතු ය.

(ii) සම්මුඛ පරීක්ෂණයක් සඳහා නියමිත වේලාවක, දන්වනු ලබන තැනකට පැමිණෙන ලෙස අපෙක්ෂකයන්ට නියම කරනු ලැබිය හැකි ය. මේ සම්බන්ධයෙන් කිසි ම ගමන් වියදමක් හෝ අන් කිසි වියදමක් හෝ ගෙවනු නො ලැබේ.

(iii) කිසියම් අපෙක්ෂකයකු ගැන නිර්දේශයක් කිරීමට යමකුට වුවමනා නම් ඔහු එසේ කළ යුත්තේ එම අපෙක්ෂකයාට සහතික පත්‍රයක් දීමෙනි. යම් අපේක්ෂකයකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් වුවත් අයථා අනුග්‍රහයක් ලබා ගැනීමකට හෝ බල පැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන් ම ඒ අපේක්ෂකයා නුසුදුසු බවට පත්වන්නේ ය.

(iv) යම් අයැදුම්කරුවකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැනගන්ට ලැබුණි නම් ඒ හේතුවෙන් ම ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් රාජකාර්යයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

(v) මේ දැන්වීමේ සඳහන් නියමයන්ට කවර ලෙසකින් වුවත් නො ගැළපෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

---

## කෘෂිකම් දෙපාර්තමේන්තුව

### කෘෂිකම් උපදේශක තනතුරු

කෘෂිකම් දෙපාර්තමේන්තුවේ කෘෂිකම් උපදේශකවරුන්ගේ පුරප්පාඩු කීපයක් සඳහා ඉල්ලුම්පත්‍ර භාර ගනු ලැබේ.

2. මෙම තනතුරුවල වැටුප් පරිමාණය මෙසේ ය. තුන් අවුරුදු ආධුනික කාලයේ මුල් අවුරුද්දේ හෝ අවුරුදු දෙක තුළ අවුරුද්දකට රුපියල් 1,080 බැගින් ද, ඊට පසු අවුරුද්දකට රුපියල් 1,620 සිට අවුරුද්දකට රුපියල් 120 වැඩිවීම් 10 කින් සහ රුපියල් 180 වැඩිවීම් 4 කින්, රුපියල් 4,620 දක්වා වැඩිවේ. (වැටුප අවුරුද්දකට රුපියල් 2,220 සහ 3,420 ට වැඩිවීමට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉම් තිබේ.) පළමුවැනි පෙලේ කෘෂිකම් උපදේශක වරයෙකුට අවුරුද්දකට රුපියල් 4,800 සිට අවුරුද්දකට රු. 180 වැඩිවීම් 3 කින් සහ රුපියල් 240 වැඩිවීම් 2 කින් රුපියල් 5,820 දක්වා වැඩි වේ. විශෙෂ පන්තියේ උපදේශකවරයෙකුට අවුරුද්දකට රුපියල් 6,060 සිට රුපියල් 240 වැඩිවීම් තුනකින් රුපියල් 6,780 දක්වා වැඩි වේ. (පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධරයෙක් දෙවැනි පෙලට පත් කිරීමේදී අවුරුද්දකට රුපියල් 2,820 ක වැටුපකින් පටන් ගැනේ.)

**3. රක්ෂාවේ කොන්දේසි.**—(අ) මෙම තනතුරු සථිර විශ්‍රාම වැටුප් සහිත ඒවාය. (ආ) මෙම තනතුරුවලට තෝරා ගනු ලබන අය දෙපාර්තමේන්තුවේ ක්ෂෙත්‍ර නිලධාරීන් නිසා ඔවුන්ට රජයේ නිවාඩු දිනයන් හා ඉරිදා දිනයන් විවේක දිනයන්සේ නොසැලකිය යුතුයි. නමුත් තමා නැති අවස්ථාවන්හි තමාගේ රාජකාර්යය නිසි ආකාර කිරීමට කටයුතු සලස්වා ඕනෑම දිනයක, ඕනෑම වේලාවක විවේක ගැනීමට හැකිය. (ඉ) තෝරා ගන්නා ලද අයදුම්කරුවන් පත්වීම ලබා අවුරුදු 3ක් ඇතුළතදී සිංහල පිළිබඳව නිපුණත්වයක් ලබා සිංහල නිපුණත්වය සම්බන්ධ විභාගයකින් සමත්විය යුතුයි. මෙම කාලසීමාව තුළ දෙමළෙන් වැඩ කිරීමේ දැනුමක්ද ලබාගත යුතුයි. (ඊ) කෘෂිකම් පාසැලේ සාමාන්‍ය සාමාර්ථයක් ඇතුව තෝරා ගන්නා ලද අයදුම්කරුවන්ට පත්වීම ලබා අවුරුදු 2ක් ඇතුළතදී ආධුනිකයන්ගේ විභාගයකින්ද සමත්විය යුතුයි.

**4. උවමනා සුසුදුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් තමාට ඇති බවට සාක්ෂි සැපයිය යුතුයි.

(අ) 1959 මැයි මස 5 වැනි දිනට වයස අවුරුදු 35 කට නොවැඩි විය යුතුය. (මෙම අංශයෙන් සුදුසුකම් ඇතිවීම සඳහා අවුරුදු 3 කට නොඅඩු කාලයක් සේවය කළ ආහාර නිෂ්පාදන නිලධාරීන්ට ඔවුන්ගේ වයසින් සේවය කරන ලද කාලය අඩු කිරීමට ඉඩ දෙනු ලැබේ.) දැනට සථිර තනතුරු දරණ රජයේ සේවකයින්ගේ ඉල්ලුම් පත් වයස සීමාවක් නොමැතිව සලකා බලනු ලැබේ.

(ආ) අයදුම්කරු පිළිගනු ලැබූ විශ්ව විද්‍යාලයක කෘෂිකර්මාන්තය සම්බන්ධ උපාධිධරයෙක් නැතිනම් පේරාදෙණියේ කෘෂිකම් පාසැලේ 1 වැනි හෝ 2 වැනි පෙළ සහතික ලත් කෙනෙක් විය යුතුය. එසේත් නැති නම් එම පාසැලෙන්ම සාමාන්‍ය සහතිකයක් ලැබ ආහාර නිෂ්පාදන නිලධාරියෙක් ලෙස අඩු වශයෙන් අවුරුදු 3ක් වත් සේවය කළ කෙනෙක් නැතහොත් පේරාදෙණියේ කෘෂිකම් පාසැලෙන් සාමාන්‍ය සහතිකයක් පමණක් ලත් කෙනෙක් විය යුතුයි.

(ඉ) තමා යහපත් චරිතයක් ඇති ශාරීරික ව සුදුසු අයෙකු විය යුතුයි.

5. අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම් පත් පහත සඳහන් සහතික පිටපත් සමඟ එවිය යුතුයි :—

(i) රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් නිකුත් කරන ලද උප්පැන්න සහතික පත්‍රයක් හෝ (උප්පැන්න ලියාපදිංචි කර නැති අපෙක්ෂකයන් සම්බන්ධයෙන් නම්) රෙජිස්ට්‍රාර් ජනරාල් තැන විසින් නිකුත් කරන ලද වයස පිළිබඳ විශෙෂ සහතිකයක්. (බව්තිස්ම සහතික හෝ ආධාර ලබන පාසැල් රෙගුලාසි සංග්‍රහය යටතේ නිකුත් කරන ලද සහතික භාර ගනු නොලැබේ.) ;

(ii) තමා ලත් උසස්ම අධ්‍යාපනික සුදුසුකම් සහතිකය ;

(iii) චරිතය සම්බන්ධව ළඟදී ලබාගත් සහතික තුනක්. (දැනට රජයේ සේවයේ සිටින අයදුම්කරුවන්ගෙන් මෙම උප වගන්තිය යටතේ සහතික ඉදිරිපත් කිරීමට උවමනා නැත.)

6. අයදුම්කරුවන් විසින් තමන්ගේ ඉල්ලුම් පත්‍රවල පහත සඳහන් තොරතුරු සඳහන් කළ යුතුයි :—

(අ) පියාගේ නම සහ උපන් සථානය :————.
(ආ) පියාගේ පියාගේ නම සහ උපන් සථානය :————.
(ඉ) පියාගේ පියාගේ පියාගේ නම සහ උපන් ස්ථානය :————.

7. රජයේ පත්වීම් වලට අදාල සාමාන්‍ය කොන්දේසි ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡෙදයේ පළ වේ.

8. 1959 මාර්තු මාසයේදී පවත්වන ලද පේරාදෙණියේ කෘෂිකම් පාසැලේ අවසාන පරීක්ෂණයේ ප්‍රතිඵල පිටවනතුරු එම පරීක්ෂණයට පෙනී සිටිය ශිෂ්‍යයින්ගෙන්ද ඉල්ලුම්පත් භාර ගනු ලැබේ.

9. අයදුම්පත් 1959 මැයි මස 5 වැනි දිනට ප්‍රථම පේරාදෙණියේ කෘෂිකම් අධ්‍යක්ෂ තැනට ලැබීමට එවිය යුතුය. අයදුම්පත් අධ්‍යක්ෂ තැනගේ පෞද්ගලික නමට නොඑවිය යුතුයි. මේ සඳහා විශෙෂ පෝර්ම කොළ නැත. සෑම අයදුම් පතක්ම ලැබුණු බව දන්වනු ලැබේ.

10. අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්වල පහත සඳහන් ප්‍රකාශය කළ යුතුය :—

" මවිසින් මෙම ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද තොරතුරු සත්‍ය බව සහ නිවැරදි බව සහතික කරමි. එම තොරතුරු අසත්‍ය බව තෝරා ගැනීමට පෙර ඔප්පු වුවහොත් මා නුසුදුස්සෙක් වන බවත්, තෝරා ගැනීමෙන් පසු එසේ ඔප්පු වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට හැකි බවත් මම දනිමි. "

ඇම්. ඇෆ්. චන්ද්‍රරත්න,
කෘෂිකම් අධ්‍යක්ෂ.

1959 අප්‍රේල් මස 8 දින,
පේරාදෙණියේ දීය.

## කලුතර දිස්ත්‍රික්කයේ මතුගම තානායමේ II වෙනි ශ්‍රෙණියේ තානායම් භාරකරු තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම්පත්‍ර එවන ලෙස කළුතර දිස්ත්‍රික්කයේ ඒජන්ත තැන විසින් මෙයින් ආරාධනය කරනු ලැබේ.

2. මේ තනතුරට අයත් වාර්ෂික වැටුප රු. 540 න් පටන්ගෙන රු. 12 හේ වාර්ෂික වැඩිවීම් 22 කින් රු. 804 තෙක් නගී. ආණ්ඩුවේ රෙගුලාසි අනුව තාවකාලික ජීවන දීමනාවක්ද ගෙවනු ලැබේ. මේ වැටුපට සහ ජීවන දීමනාවට අතිරේක වශයෙන් පහත සඳහන් දීමනාවන්ද තෝරා පත්කරගනු ලබන තැනැත්තාට ගෙවනු ලැබේ :—

(1) රෙදිපිළි සේදවීම සඳහා දීමනාව මසකට රු. 17.00.
(2) කසල ශෝධන දීමනාව මසකට රු. 10.00.
(3) නාන කාමර පිරිසිදු කිරීමට මසකට රු. 20.00

මෙය ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත තනතුරකි.

3. තානායම් භාරකරුට නිවාඩු දුම්රිය බලපත්‍ර දෙනු ලැබේ. එහෙත් තානායම් භාරකාරවරු සතියේ දින හතම වැඩකළ යුතු සේවකයන්ගේ ගණයට අයත් වන හෙයින් රජයේ නිවාඩු දිනයන්හි නිවාඩු නොලැබේ.

4. අයදුම්කරුවන් ලාංකිකයන් විය යුතුයි. 1959 මැයි මස 8 වෙනි දිනට අයදුම්කරුගේ වයස අවුරුදු 25ට අඩු නොවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර එවිය යුත්තේ තානායම්පලවල හෝ වෙනත් ආහාරපාන සපයන ස්ථාන පාලනය කිරීම පිළිබඳව පළපුරුද්දක් ඇති අය පමණකි. සිංහල සහ දෙමළ හෝ කියවීමට සහ ලිවීමටද ඉංග්‍රීසි කථා කිරීමට හා තේරුම් ගැනීමටද, හැකිවූ ඉල්ලුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ. දේශීය හා බටහිර කෑම වර්ග පිළියෙළ කිරීමේ සමත්කම අවශ්‍යතම සුදුසුකමකි. තවද ගණන් තැබීමේ පළපුරුදු කෙනෙක් විය යුතුයි.

5. තෝරාගනු ලබන අයදුම්කරු 3 අවුරුද්දක අස්ථිර කාලයක් ගත කළ යුතුයි. තවද ඔහු ආණ්ඩුවේ සෑම ව්‍යවස්ථා සහ රෙගුලාසි වලට යටත් වන්නේය.

6. මෙම තනතුරේ සේවය කිරීම සඳහා සුදුසු ශාරීරික තත්වයකින් සිටිද යන්න දැනගනු සඳහා රජයේ වෛද්‍ය නිලධාරියකු විසින් පවත්වන වෛද්‍ය පරීක්ෂණයකින් තෝරාගත් අයදුම්කරු සමත්විය යුතුයි. මේ හැර අවුරුද්දකට වරක්ද වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතුයි.

7. තෝරාගනු ලබන අයදුම්කරු රු. 1,000ක ඇපයක් තැබිය යුතුයි. මේ ඇප මුදල පත්වූ වහාම රු. 250ක මූලික තැන්පත් මුදලකින් හා ඉතිරි කොටස මසකට රු. 10 බැගින් ගෙවිය යුතු වේ.

8. තෝරාගනු ලබන අයදුම්කරු විසින් සිය පඩියෙන් සියයට 4ක් වැන්දඹු සහ අනාථදරු විශ්‍රාම අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුයි.

9. අයදුම්කරුවන් විසින් මෙහි පහත සඳහන් ලියකියවිලිවල පිටපත් තම ඉල්ලුම්පත්‍රය සමග ඉදිරිපත් කළ යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (අංක බී. 78 ඒ දරණ ෆෝර්මයෙහි) ;

(ii) අධ්‍යාපන සහතිකපත්‍ර ;

(iii) මෑතදී ලබාගත් චරිත සහතික පත්‍ර තුනක්.

10. ආණ්ඩුවේ සේවයේ නියුක්ත වූවන්ගේ අයදුම්පත් සලකා බලනු ලබන්නේ ස්වකීය දෙපාර්තමේන්තු මගින් එව්වොත් පමණි.

11. අයදුම්කරුවකු ගැන නිර්දේශ කිරීමට අදහස් කරන අයෙකු සහතිකයක් දීමෙන් එසේ කළ යුතුයි. අනියම් ලෙස උදව් සෙවීම හෝ පොළඹවා ගැනීමට තැත් කිරීම අයදුම්කරුවකු නුසුදුස්සෙකු කිරීමට හේතු වේ.

12. තෝරා ගැනීමට පෙර අයදුම් පත්‍රයෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය බව පෙනී ගියහොත් එයින්ම එකී අයදුම්කරුවා නුසුදුස්සෙකු බවට පත්වන අතර තෝරා ගැනීමෙන් පසු එවැන්නක් අනාවරණය වුවහොත් ඔහු රාජකාර්යයෙන් පහකර දැමීමට සිදුවේ.

13. අයදුම්කරුවන් නියම කරන දිනක සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුයි. ඒ සඳහා ගමන් ගාස්තු හෝ වෙනත් කිසිම වියදමක් හෝ ගෙවනු නොලැබේ.

14. මෙහි පහත දැක්වෙන ආකෘතියේ අන්දමට පිළියෙල කරන ලද අයදුම්පත් 1959 මැයි මස 8 වෙනි දිනට පෙර පුද්ගලික මගේ නමට නොව, "කළුතර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත තැන, කළුතර" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුයි.

ඒ. ඇම්. ඇස්. පෙරේරා,
ආණ්ඩුවේ ඒජන්ත තැන.

1959 අප්‍රේල් 11 වෙනි දින,
කච්චේරිය, කළුතර.

### ආකෘති පත්‍රය

**කළුතර දිස්ත්‍රික්කයේ මතුගම තානායමේ II වැනි ශ්‍රෙණියේ තානායම් භාරකරු තනතුර**

(1) සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) :————.

(2) ලිපිනය :————.

(3) ජාතිය (ලාංකිකයෙක්ද නැද්ද යන වග සඳහන් කළ යුතුයි) : ————.

(4) අයදුම්කරුගේ උපන් දිනය සහ ස්ථානය :————.

(5) අයදුම්කරුගේ පියාගේ උපන් දිනය සහ ස්ථානය :————.

(6) විවාහකද අවිවාහකද යන වග :————.

(7) අධ්‍යාපනික සුදුසුකම් සහ අවසාන වරට සමත් වූ විභාගය හා දිනය :————.

(8) ඉගෙනීම ලැබූ ස්ථානය සහ පාසැලින් අස්වූ දිනය :————.

(9) (අ) පාසැලින් අස්වූ පසු නිරතවූ රක්ෂා හා වකවානු සහ වෘත්තිය පිළිබඳ සම්පූර්ණ විස්තර :————.

(ආ) මීට ඉහත රජයේ රක්ෂාවක නිරතව සිටියේ නම් ඉන් අස්වීමට හේතුවූ කරුණු සහ සම්පූර්ණ විස්තර : ————.

(ඇ) තානායම් භාරකරුවකු සේ රජය යටතේ හෝ පළාත් පාලන සේවා මෙහෙය යටතේ සේවය කර තිබේ නම් : ————.

(ඈ) (i) දැන් දරණ තනතුර, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය : ————.

(ii) වර්තමාන වැටුප හා වැටුප් ක්‍රමය :————.

(iii) දින සහිත රැකී රක්ෂා පිළිබඳ වාර්තාව :————.

(10) සිංහල හා දෙමළ කියවීමට, ලිවීමට හා අවබෝධ කර ගැනීමට ඇති දක්ෂතාවය :————.

(11) විශේෂ සුදුසුකම් පිළිබඳ විස්තර :————.

(12) චරිත සහතික පත් ලබාගත් අයගේ නම් සහ දරණ තනතුරු :————.

(13) තානායම් වැඩ ගැන ලබා ඇති පළපුරුද්ද හෝ වෙනත් විශේෂ සුදුසුකම් :————.

(14) ක්‍රිමිනෙල් අපරාධයක් සම්බන්ධයෙන් නීති උසාවියකින් වරදකරුවකු වී තිබේනම් එහි දිනය, නඩු අංකය සහ කෙබඳු අපරාධයක්දැයි සඳහන් කරන්න :————.

(15) ණය ගනුදෙනුවලින් හා මුදල් සම්බන්ධ කරදර වලින් නිදහස් අයෙක්ද යන වග :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

---

## ටැන්ඩර් කැඳවීමේ දැන්වීම්

### ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

කොළඹ මහා භාණ්ඩාගාරයේ 270 වැනි කාමරයෙහි වූ මුදල් අමාත්‍යංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් (තැපැල් ලිපිනය: තැ. පෙ. 500, කොළඹ 1) වහපු වර්ගයේ ටොන් 3 තේ ඩීසල් ලොරි දෙකක් සැපයීම සඳහා 1959 මැයි 5 වැනි අඟහරුවාදා පෙරවරු 9.30 තෙක් ටෙන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

ටෙන්ඩර් පත්‍ර විවෘත කරන ඉහත කී වේලාවේදී ටෙන්ඩර්කරුවන්ට ඉදිරියේ සිටීමට ඉඩ දෙනු ලැබේ.

කොළඹ පාසන්ස් පාරේ ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරි තැනගෙන් ෆෝර්ම කොළ ලබාගෙන ටෙන්ඩර් පත්‍ර ලියා අනු පිටපතක්ද සහිතව එවිය යුතුයි.

ටෙන්ඩර් තැන්පත් මුදලක් වශයෙන් රුපියල් 50ක් ආණ්ඩුවේ බඩු ගබඩාවෙහි හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ බැඳ ඒ බවට කුවිතාන්සියක් ඉරිපත් කළ විට 1959 මැයි 4 වැනි සඳුදා දවල් 12 වන තෙක් ටෙන්ඩර් ෆෝර්ම කොළ දෙනු ලැබේ.

වැඩි විස්තර ආණ්ඩුවේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ලූ. ඒ. විජෙසිංහ,
ගබඩා අධිකාරී.

1959 අප්‍රේල් 17 වැනි දින,
කොළඹදීය.

## රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුව

### ජාත්‍යන්තර සහයෝගිතා සංවිධානය (ICA) ටැන්ඩර් දැන්වීමයි

ආහාර හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිතුමන් විසින් 1959 ජූනි 23 වෙනි දින පෙරවරු 9.30 දක්වා කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට පහත සඳහන් ද්‍රව්‍ය සැපයීම සඳහා ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

| ද්‍රව්‍ය | ටෙන්ඩර් අංකය |
|---|---|
| (1) රෝද හතරම ක්‍රියා කරවියහැකි රථ | I C A-230 |
| (2) නෙතමනය මැනීමේ උපකරණයක් ආදී කරුණු 13ක් | I C A-233 |

කොළඹ පාසන්ස් පාරේ රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවේ අධිකාරී තැනගෙන් ටැන්ඩර් පෝර්ම ලබා ගත හැක. ටැන්ඩර් පෝර්ම ලබාගැනීමට පෙර ටැන්ඩර් කරුවන් විසින් තම තමන් වෙනුවෙන් බඩු සපයන පිටරටවල ඇති ප්‍රධාන වෙළඳ ආයතනයන්ගේ නම් හා ලිපිනයන්ද සැපයිය යුතුයි.

වැඩි විස්තර රජයේ බඩු ගබඩා දෙපාර්තමේන්තුවෙන් ලබා ගත හැක.

ඇල්. ඒ. විජේසිංහ,
ගබඩා අධිකාරී.

1959 අප්‍රේල් 8 දින,
කොළඹ 1.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ ප්‍රදේශයේ ගංවතුරෙන් කැඩී බිඳීගිය පහලවෙල අමුන සෑදීම සඳහා ටැන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 29 වෙනි දින පෙරවරු 10 වනතෙක් එතුමාගේ කාර්යාලයේ දී භාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 6,000කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතුයි.

ටැන්ඩර් පත්‍ර 16.4.59 වෙනි දින සිට 28.4.59 වෙනි දින දක්වා මාතලේ වාරිමාර්ග කාර්යාලයෙන් සහ මහනුවර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් නිකුත් කරනු ලැබේ.

මහනුවර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරුතුමා විසින් 29.4.59 වෙනි දින පෙරවරු 10.30ට ටැන්ඩර් පත්‍ර විවෘත කරනු ලබන අවස්ථාවේ දී කොන්ත්‍රාත්කරුවනට ඉදිරිපත් වීමට අවසර තිබේ.

වාරිමාර්ග කාර්යාලය,
මාතලේ, 3.4.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

මහනුවර ප්‍රාදෙශික වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මාතලේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ ස්ථිර නිවාස සෑදීම සඳහා ටෙන්ඩර් පත්‍ර 1959 අප්‍රේල් මස 29 වෙනිදා පෙරවරු 10 වන තෙක් එතුමාගේ කාර්යාලයේ දී භාරගනු ලැබේ.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 26,000 කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වූ කොන්ත්‍රාත්කරුවන් පමණක් ඉල්ලුම් කළ යුතුයි.

ටැන්ඩර් පත්‍ර 20. 4. 59 වෙනි දින සිට 28. 4. 59 වෙනි දින දක්වා මාතලේ වාරිමාර්ග කාර්යාලයෙන් නිකුත් කරනු ලැබේ.

වැඩිපුර විස්තර මාතලේ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

සී. පී. ආර්. සිංහම්,
උප ප්‍රාදෙශික වාරිමාර්ග නිලධාරි තැන,
මාතලේ.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙල ඌව කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 අප්‍රේල් 29 වෙනි බදාදා දින පූර්වභාග 10 තෙක් නුවරඑළියේ ඌව කොට්ඨාශයට ගෙපොල 'බී' සමතලා කිරීම, පාරවල් කැපීම හා කටුකම්බි ගැසීම සඳහා ටැන්ඩර් භාරගනු ලැබේ. ටැන්ඩර් හා වැඩි විස්තර ලබාගත හැක්කේ බදුල්ලේ වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කාර්යාලයෙනි.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රු. 20,000 හා ඊට වැඩියෙන් ලියා පදිංචි කොන්ත්‍රාත් කරුවන්ට රු. 25ක ටැන්ඩර් මුදලක් තැන්පත් කළ පසු ටැන්ඩර් පත්‍ර ලබාගත හැක. ටැන්ඩර් පත්‍ර 27.4.59 තෙක් නිකුත් කරනු ලැබේ.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

බණ්ඩාරවෙළ. ඌව කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් 1959 මැයි 6 වැනි බදාදා පූ. භා. 10 තෙක්, මොණරාගල උප කොඨාශයට අයත් ඇතිමෝල වැවේ වැව්කන්ඩිය පිරවීම සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. මේ සඳහා අවශ්‍ය සෑම විස්තරයක්ම ලබාගත හැක්කේ මොණරාගල වාරිමාර්ග නිලධාරිතැනගේ කාර්යාලයෙනි.

3. ටෙන්ඩර් පත්‍ර ලබාගැනීමට හැකි වනුයේ, වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 50,000 හෝ ඊට වැඩි මුදල් ගණන් වලට ලියා පදිංචි වී ඇති කොන්ත්‍රාත්කරුවන්ට පමණකි. මේ සඳහා රුපියල් 50ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය.

වාරිමාර්ග නිලධාරිතැන,
මොණරාගල උප කොඨාශය.

7.4.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

පොළොන්නරුවේ ඊශාන දිසාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තුමා විසින් මකුල්කැලේ වැවේ අඩි 300ක් දිග වාන බැඳීම සඳහා 1959ක් වූ අප්‍රේල් මස 29 වැනි බදාදා පෙරවරු 9.30 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. හිඟුරක්ගොඩ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරන ලද ටෙන්ඩර් පත්‍ර දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තර හිඟුරක්ගොඩ වාරිමාර්ග කාර්යාලයෙන් ලබාගත හැක.

3. වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 23,000කට හෝ ඊට වැඩි මුදලකට ලියා පදිංචි වී ඇති රුපියල් 25ක් කච්චේරියේ හෝ මෙම කාර්යාලයේ තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 1959 අප්‍රේල් මස 20 වැනි දින සිට 25 වැනි දින දක්වා ටෙන්ඩර් පත්‍ර නිකුත් කරනු ලැබේ.

4. දැනට රජයේ කොන්තරාත් කරමින් සිටින කොන්තරාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිලධාරීන් ගෙන් ලබාගත් සහතික පත්‍ර ටෙන්ඩර් පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

5. ටෙන්ඩර් පත්‍ර විවෘත කරන අවස්ථාවේදී පෙනී සිටීමට කැමැති කොන්තරාත් කරුවන් 1959 ක්වූ අප්‍රේල් මස 29 වැනි දින පෙරවරු 9.30 ඊශාන දිශාව භාර ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුතුමාගේ කාර්යාලයට පැමිණිය යුතුයි.

ඒ. ඇස්. ද සිල්වා,
වාරිමාර්ග ඉංජිනේරු තැන, කවුඩුල්ල උප කොට්ඨාශය.

හිඟුරක්ගොඩ, 8.4.59.

---

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

ඌව කොට්ඨාශය භාර ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් මොනරාගල උප කොට්ඨාශයේ මාගන්දන ව්‍යාපාරයේ ජල හාණි ප්‍රතිශංස්කරණ සඳහා රුපි. 12,000 හා ඊට වැඩි ගණන් වලට ලියාපදිංචි වී ඇති අයගෙන් 29.4.59 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

මොණරාගල උප කොට්ඨාශය භාර නිලධාරි තැන වෙතින් ලබාගත හැකි ටෙන්ඩර් පෝර්මකොළ දෙකම පූරවා ඌව කොට්ඨාශයේ ප්‍රාදේශික වාරිමාර්ග ඉංජිනේරු තැනවෙත ඉහත සඳහන් දින එකී වේලාවට හෝ ඊට පළමු ලැබෙන්නට සැලැස්විය යුතුයි.

පෝර්ම කොළ ගැනීමේදී රු. 25 තැන්පත් කළ යුතුයි. මෙම මුදල කච්චේරියේ හෝ මොනරාගල වාරිමාර්ග කාර්යාලයේදී භාරදී රිසිට් පතක් ලබාගත හැක.

සෑම ටෙන්ඩර්යකම තමා ඉල්ලුම් කරන වැඩයේ නම හා තමාට දෙන ලද පෝර්ම කොළ ගණනද සඳහන් කළ යුතුය.

ඕ. ඇස්. චන්ද්‍රරත්න,
මොණරාගල වාරිමාර්ග නිලධාරි තැන.

## වාරිමාර්ග දෙපාර්තමේන්තුව

කොළඹ 8 කොටාරෝඩ්හි, බටහිර කොට්ඨාශය භාර ප්‍රාදේශිය වාරිමාර්ග ඉංජිනේරු තැන විසින් රත්නපුර දිස්ත්‍රික්කයේ බලන්ගොඩ වාරිමාර්ග කාර්මික සහකාර නිළධාරි තැනගේ ප්‍රයෝජනය සඳහා අර්ධ ස්ථිර නිවාසයක් තැනවීම පිණිස 1959 ක්වූ මැයි මස 12 වැනි අඟහරුවාදා පෙරවරු 11.30 වනතුරු ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල පිළියෙල කරනලද ටෙන්ඩර් පත්‍ර පිටපත් දෙක බැගින් මුද්‍රා තැබූ කවරවල බහා ඉදිරිපත් කළ යුතුයි. සැලැස්ම හා වැඩ පිළිබඳ විස්තරද රත්නපුර වාරිමාර්ග කාර්යාලයයෙන් ලබාගත හැක.

වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ රුපියල් 25,000 කට හෝ ඊට වැඩි මුදලකට හෝ ලියා පදිංචි වී ඇති රුපියල් විසිපහක් (25/-) ටෙන්ඩර් සඳහා කච්චේරියක තැන්පත් කළ බැව් පෙන්වා සිටින කොන්ත්‍රාත් කරුවනට 20. 4. 59 වැනි දින සිට 8. 5. 59 දින දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ලැබේ.

දැනට රජයේ කොන්ත්‍රාත් කරමින් සිටින කොන්ත්‍රාත් කරුවන් විසින් එම වැඩ සතුටුදායක අන්දමින් කෙරීගෙන යන බවට ඒවා භාර නිළධාරින්ගෙන් ලබාගත් සහතිකයක් ටෙන්ඩර් ආකෘති පත්‍ර ඉල්ලුම් කිරීමේදී ඉදිරිපත් කළ යුතුයි.

කරුණු නොවිමසා එකක් හෝ සියලුම ටෙන්ඩර් පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමේ හෝ යම් ටෙන්ඩරයක යම් කොටසක් පිළිගැනීමේ හෝ අයිතිය රජය සතුවේ.

කේ. බී. ඊ. ද ඇස්. කරුණාරත්න,
රත්නපුර උප කොට්ඨාශය භාර වාරිමාර්ග ඉංජිනේරු තැන.

වාරිමාර්ග කාර්යාලයය,
හිදැල්ලන, රත්නපුර, 1959 අප්‍රියෙල් 7 දීය.

---

අංක අයි/පී. කේ. ඇස්/522/1

## පුත්තලම් දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්ම වැඩ

පහත දක්වන සුළු වාරි කර්ම වැඩ සඳහා මෙම කච්චේරියෙන් ලබා ගන්නාලද ආකෘති පත්‍රවල එවන ගණන් යෝජනා පත්‍ර 1959 අප්‍රේල් මස 22 වැනි දින පෙරවරු 10 දක්වා භාරගනු ලැබේ:—

1. කුඩා වැව කුඩා බැම්ම වැඩි දියුණු කිරීම.
2. කුඩා වැව වැඩි දියුණු කිරීම.
3. මුන්නේස්සරම ඇලේ රෙගුලේටර 3ක් ඉදි කිරීම.

එක එක වැඩය වෙනුවෙන් රුපියල් දහයක මුදලක් තැන්පත් කිරීමෙන් 1959 අප්‍රේල් මස 21 වැනි දින පස්වරු 3 වනතුරු ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබා ගත හැක. සමුපකාර ආයතන සහ ග්‍රාම සංවර්ධන සමිති ගණන් යෝජනා ආකෘති පත්‍ර ලබා ගැනීමේදී මුදල් තැන්පත් කිරීම අවශ්‍ය නොවේ.

ගණන් යෝජනා පත්‍ර විවෘත කිරීම 1959 අප්‍රේල් මස 22 වැනි දින පෙරවරු 10ට පටන්ගන්නවා ඇත. ඒ වේලාවට ඉල්ලුම්කරුවන්ටද පෙනී සිටීමට අවසර තිබේ.

මේ සම්බන්ධයෙන් වැඩි විස්තර පුද්ගලිකව හෝ ලියවිල්ලකින් විමසීමෙන් මගෙන් ලබා ගත හැක.

ඇම්. ඇෆ්. රාසනායගම්,
ආණ්ඩුවේ ඒජන්ත වෙනුවට.

1959 අප්‍රේල් මස 6 වැනි දින,
පුත්තලම් කච්චේරියේදීය.

---

## රත්නපුර දිස්ත්‍රික්කයේ සුළු වාරි කර්ම වැඩ

පහත සඳහන් උප ලේඛනයෙහි දක්වෙන රත්නපුර දිස්ත්‍රික්කයේ තැනීමට යෝජිත සුළු වාරි කර්මාන්තයන් සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර වර්ෂ 1959ක්වූ අප්‍රේල් මස 28 වැනි දින පෙරවරු 9.30 තෙක් මවිසින් ලියා පදිංචි කරන ලද කොන්ත්‍රාත්කරුවන්ගෙන් සහ ග්‍රාම සංවර්ධන සමිතිවලින් ද භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ලියා පදිංචි කරන ලද තැපැලෙන් එවීමට අදහස් නොකරන කොන්ත්‍රාත්කරුවනට ඔවුන්ගේ ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර අතින්ම හෝ ඔවුන්ගේ නියෝජිතයන්ගේ අතින්ම හෝ මගේ කාර්යාලයීය සහකාර තැනට භාරදිය හැක.

3. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර සීල් තබා පිට කවරයේ ටෙන්ඩර් ඉල්ලුම් කරන වැඩය සඳහන් කිරීමට හා තමාගේ නම හා ලිපිනය එහි සඳහන් කිරීමට අමතක නොකළ යුත්තේ ඒ විස්තර සඳහන් කිරීම අත්‍යවශ්‍ය හෙයිනි.

4. එක් එක් වැඩය සඳහා ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර දෙක බැගින් එවිය යුතුවේ. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍රවල දෙවැනි පිටපත් පරීක්ෂා කර බැලීම අවශ්‍යයයි හැඟෙතොත් ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති සමඟ සාකච්ඡා කර ඒ සඳහා අවශ්‍ය විධිවිධාන සලස්වා ගත හැක.

5. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ගැන සළකා බැලීමට එදිනම පෙරවරු 10ට කොන්ත්‍රාත්කරුවන් ඉදිරියෙහි දීම ඒවා විවෘත කරනු ලබන හෙයින් කොන්ත්‍රාත්කරුවෝ එදින නියමිත වේලාවට මෙම කච්චේරියේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනී සිටිය යුත්තෝය.

6. වැඩි විස්තර හා ආකෘති පත්‍ර 1959ක්වූ අප්‍රේල් මස 27 වැනි දින දහවල් 12 තෙක් මගෙන් ලබා ගත හැක.

මේ ආකෘති පත්‍ර ලබාගැනීමේදී ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේදී 889 (අයි) වැනි මුදල් රෙකුලාසිය අනුව, ආපසු ගෙවන තැන්පත් ඇප මුදල පහත සඳහන් ආයතනවලට ටෙන්ඩර් පත්‍ර නිකුත් කිරීමේ ලබා නොගතයුතුයයි තීරණය කොට තිබේ:—

(අ) සමුපකාර තොග වෙළඳ ආයතනය.

(ආ) වෙනත් ආණ්ඩුවලට අයත් රජයේ ව්‍යාපාර සංවිධාන. නිදසුනක්, "වෛනා නැෂනල් මැෂිනරි ඉම්පෝට් කොපරේෂන්"

(ඇ) ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂ තැන විසින් අනුමත කරනු ලැබූ ග්‍රාම සංවර්ධන සමිති හා,

(ඈ) සමුපකාර සමිති පිළිබඳ රෙජිස්ට්‍රාර් තැන විසින් ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති.

7. ටෙන්ඩර් ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කිරීමේදී පළමුව, තමා ඉල්ලුම් කරන වැඩය ගැන තමාම සියලු විස්තර පරීක්ෂාකර බලා ගත් බැව් ඉල්ලීම් ගැන සැළකීමේදී හඟිනු ලැබේ.

### උපලේඛනය

| කටයුත්ත (වැඩය) | පිහිටි ගම | කෝරළය |
|---|---|---|
| 1. කුඹුක්ගහ කුඹුර අමුණ තැනීම. | දකුණු කරඳන. | කුරුවිට |
| 2. හලදෙල අමුණ තැනීම. | දකුණු කරඳන. | කුරුවිට |
| 3. එරත්නාගොඩ අමුණ තැනීම. | වතුයාය. | කුරුවිට |
| 4. උඩදෙනිය අමුණ තැනීම. | බෝපැත්ත. | කුරුවිට. |
| 5. මොළමුරේ දෙළයාය අමුණ තැනීම. | නිවිතිගල. | නවදුන්. |
| 6. හෝපිටිගල අමුණ තැනීම. | හෝපිටිගල. | නවදුන්. |
| 7. හඳගිරිය මහ අමුණ දියුණු කිරීම. | හඳගිරිය. | කඩවත හා මැද |
| 8. ගම්මැදිවෙල අමුණ තැනීම. | ගලතුරේ | කොලොන්න. |
| 9. කරඳකැටියේ අමුණ තැනීම. | කරඳකැටිය | කුකුළු. |
| 10. කෝන්ගහදෙළ පිල්ල අළුත් වැඩියා කිරීම. | කොලොන්න | කොලොන්න. |
| 11. ඇරුපෝරුව අමුණ අළුත් වැඩියා කිරීම. | ඇරුපෝරුව | කොලොන්න |

එල්. බී. අබයරත්න,
රත්නපුර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්තතැන.

1959 අප්‍රේල් මස 1 වන දින,
රත්නපුර කච්චේරියේදීය.

---

## ග්‍රාම සංවර්ධන සහ ගෘහ කර්මාන්ත දෙපාර්තමේන්තුව

වැලිගම, රජයේ මැටි බඳුන් කර්මාන්ත මධ්‍යස්ථානයෙහි පහත සඳහන් වැඩ සඳහා 59. 5. 9 දින පෙරවරු 10.30 දක්වා මා විසින් ටෙන්ඩර් පත්‍ර බාරගනු ලැබේ:—

1. කම්බි ගැසීම,
2. පැති බැම්මක් බැඳීම,
3. රියං බදම්යක් ඇඳීම සහ
4. මැටි බඳුන් ඇඳීමේ යන්ත්‍ර සවි කිරීම.

ජී. වී. පී. සමරසිංහ,
ග්‍රාමසංවර්ධන සහ ගෘහ කර්මාන්ත අධ්‍යක්ෂකතැන.

කොළඹ 7,
ටොරිංටන් චතුරශ්‍රය,
1959 අප්‍රේල් මස 13 දින.

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### සිංහල කියවීම් පොත් සැපයීම—1958/59

සිංහල කියවීම් පොත් සැපයීම සඳහා, 1959 මැයි මස 8 වන කිවි දින පෙරවරු 10.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින් ටැන්ඩර් පත්‍ර භාරගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තු වන අය විසින්, විස්තර ලේඛණ ඉල්ලා සිටි විට, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙනුවෙන්, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. කොළඹ ටැන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියකද රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1959 මැයි මස 7 වන දින තෙක් සාමාන්‍ය රාජකාරි කාලය තුළදී ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්. සී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1959 අප්‍රේල් මස 11 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

### සිංහල ගණිත් පොත් හා ආගමික පොත් සැපයීම—1958-59

සිංහල ගණිත් පොත් හා ආගමික පොත් සැපයීම සඳහා, 1959 මැයි මස 8 වන කිවි දින පෙරවරු 10.30 වන තෙක් කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපතිවරයා විසින්, ටැන්ඩර් පත්‍ර භාර ගනු ලැබේ.

2. ටැන්ඩර් පත්‍ර එවීමට බලාපොරොත්තුවන අය විසින්, විස්තර ලේඛණ ඉල්ලා සිටි විට, අධ්‍යාපන අධ්‍යක්ෂවරයා වෙනුවෙන්, කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ බඩුබාහිරා සැපයීමේ ශාඛාව විසින් ඒවා ඔවුනට නොමිලයේ සපයනවා ඇත.

3. කොළඹ ටැන්ඩර්කරු භවතුන් විසින් අධ්‍යාපනාධ්‍යක්ෂ තැන නමට කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ. සී. ශාඛාවෙහිද, කොළඹින් පිට අය විසින් කොළඹින් පිට කච්චේරියකද රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කළ විට, 1959 මැයි මස 7 වන දින තෙක් සාමාන්‍ය රාජකාරී කාලය තුලදී ටැන්ඩර් පෝර්ම නිකුත් කරනු ලැබේ.

එල්, සී. එස්. කරුණාරත්න,
අධ්‍යාපනාධ්‍යක්ෂ වෙනුවට.

1959 අප්‍රේල් මස 11 වන දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදීය.

---

## අධ්‍යාපන දෙපාතීමේන්තුව

කොළඹ 2 මලයි වීදියේ අධ්‍යාපන දෙපාතීමේන්තුවේ ටැන්ඩර් මණ්ඩලයේ සභාපති තැන විසින් 1959 මැයි මස 8 දින පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| පාසැලේ නම | | වැඩ විස්තරය |
|---|---|---|
| අ/බෝගහවැව විද්‍යාලය | ... | ගුරුනිවාස |
| අ/කුඹුක්වැව විද්‍යාලය | ... | එම |
| අ/ගල්කිරියගම විද්‍යාලය | ... | එම |
| අ/අමුනිච්චිය විද්‍යාලය | ... | එම |
| අ/කළුඇබේ විද්‍යාලය | ... | එම |

සංලක්‍ෂ්‍යය : අ = අනුරාධපුර දිස්ත්‍රික්කය

2. රුපියල් 10,000 හෝ වැඩි ගණනට අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ රුපියල් 20,000 හෝ වැඩි ගණනකට ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි වැඩ සඳහා ලියා පදිංචිවී සිටින අයට කොළඹ අධ්‍යාපන අධ්‍යක්‍ෂ තුමාගේ කාර්යාලයේ ඒ. සී. ශාඛාවෙන් හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියකින් වැඩය සඳහා රුපියල් 100 ක් තැන්පත් කළ කුවිතාන්සියක් අනුරාධපුර අධ්‍යාපන නිලධාරීන්ට ඉදිරිපත් කිරීමෙන් 1959.5.7 වෙනි දින පස්වරු 3.30 දක්වා ටෙන්ඩර් පත්‍රිකා ලබාගත හැකි වේ. මනිඕඩර්, පෝස්ටල් ඕඩර්, චෙක්පත්, භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් පත්‍ර සඳහා මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය මුදල් ගෙවීමේ කුවිතාන්සි කොළඹ, අධ්‍යාපන අධ්‍යක්‍ෂ තුමාගේ කායඹාලයයේ ගොඩනැගිලි ශාඛාවෙන් හෝ අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනිගෙන් හෝ ලබාගත හැකි. මුදල් ගෙවීමේ කුවිතාන්සි නිකුත් කරනු ලබන්නේ දෙවන ඡේදයේ සඳහන් පරිදි ලියා පදිංචිවී සිටින බව ඔප්පු කළ හැකි අයට පමණි.

4. ඉහත සඳහන් පරිදි පිටපත් තදකකින් යුත් ටෙන්ඩර් පත්‍රිකා අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනිගෙන් ලබාගත හැක. මේ සම්බන්ධ සැලැස්මවල්, හා සියළුම වැඩි විස්තරද අනුරාධපුර අධ්‍යාපන නිලධාරිනිගෙන් ලබාගත හැක. කොළඹ 2, මලයිවීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති තැනට ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් යැවිය යුතුයි. දේශීය ටෙන්ඩර් කරුවන් විසින් ටෙන්ඩර් පත්‍රිකා ලියා පදිංචි කළ තැපෑලෙන් එවීමට අකැමැති නම් ඔවුන් හෝ ඔවුන්ගේ ඒජන්තවරුන් සීල් තබන ලද ටෙන්ඩර් අධ්‍යාපන දෙපාතීමේන්තුවේ කායඹාල සහකාර තැනට භාරදී, එසේ භාරගත් බවට ඒ විගසම ලියවිල්ලක් ලබාගත යුතුයි. මුද්‍රාව තබන ලද ටෙන්ඩර් පත්‍රිකා ඇතුලත් කවරය මත ටෙන්ඩර් කරුගේ නම සහ ලිපිනයත් වැඩෙහි විස්තරත් සඳහන් කළ යුතුයි.

5. කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන දෙපාර්තමේන්තුවේදී 1959.5.8 දින පස්වරු 2.30 ට ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට පෙනී සිටීමට අවසර දෙනු ලැබේ. ටෙන්ඩර් පත්‍රිකා විවෘත කරණ නිලධාරි තැන විසින් ටෙන්ඩර් කරුවන්ගේ නම් සහ ඔවුන්ගේ ගණන් පැමිණ සිටින ටෙන්ඩර් කරුවන්ට කියවනු ලැබේ.

6. ටෙන්ඩර්කරුවන් ඔවුන්ගේ ඉල්ලීම් ටෙන්ඩර් පත්‍ර භාර ගැනීමේ අවසාන දිනයේ සිට සති හයක කාලයක් තුළ විවෘතව තැබිය යුතුය.

7. වෙනත් අවශ්‍ය විස්තර උතුරු මැද පළාතේ අධ්‍යාපන කායඹාලයයෙන් දැන ගත හැකි අතර ටෙන්ඩර් ලියකියවිලිද මෙහිදී පරීක්‍ෂා කර බැලිය හැකියි.

8. තෝරාගනු ලැබූ ටෙන්ඩර් කරු විසින් සේවයේ යෙදිය යුත්තේ පුහුණු හෝ වේවා නුපුහුණු හෝ වේවා, ලාංකික කම්කරුවන් ය. ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙන්ම කම්කරුවන් හැකිතාක් දුරට බඳවා ගත යුතුය. සේවයේ යෙදිය යුත්තේ ලාංකික කම්කරුවන් හා ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේම කම්කරුවන් ම පමණක් බවට කොන්දේසියක් කොන්ත්‍රාත්තුවට ඇතුළත් කරනු ලැබේ. ලාංකික නොවූ කම්කරුවන් හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයෙහි නොවන කම්කරුවන් හෝ සේවයේ යෙදවීමට අධ්‍යාපනාමාත්‍යාංශයේ සථිර ලේකම්වරයාගේ සම්මුතිය ඇති අධ්‍යාපනාධ්‍යක්‍ෂවරයා විසින් අවසර දී ඇති විශෙෂ අවස්ථාවන්හිදී හැර අන් සෑම විටම ඉහතකී කොන්දේසි නො පිළිපැදීම කොන්ත්‍රාත්තුව අවලංගු කරනු ලැබීමටද යටත් වේ. ලාංකික නොවූ හෝ ටෙන්ඩරයට අයත් වැඩය කරනු ලබන ප්‍රදේශයේ හෝ නොවන කම්කරුවන් ඉහතකී අනුමතිය හෝ සම්මුතිය ලබා නොගෙන සේවයේ යෙදීම තහනම්ය.

ඉව්ලින් ප්‍රනාන්දු,
උතුරු මැද පළාතේ අධ්‍යාපන නිලධාරිනී.

අධ්‍යාපන කායඹාලයය,
1959 4. 7. දින,
අනුරාධපුරය.

---

## අධ්‍යාපන දෙපාර්තමේන්තුව

කොළඹ 2, මලයි වීදියේ, අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිතැන විසින් 1959 මැයි මස 8 වැනි සිකුරාදා පස්වරු 2.30 දක්වා පහත සඳහන් වැඩ සඳහා ටෙන්ඩර් පත්‍ර භාරගනු ලැබේ :—

| | පාසලේ නම | කළයුතු වැඩය |
|---|---|---|
| (1) | කු/කොළඹගම සි. මි. පා. පාසල් | ගොඩනැගිලි |
| (2) | කු/බක්මීවැව සි. මි. පා. පාසල් | ගොඩනැගිලි |
| (3) | කු/වෙන්නොරුව සි. මි. පා. පාසල් | ගොඩනැගිලි |

සංලක්‍ෂ්‍යය : කු = කුරුණෑගල දිස්ත්‍රික්කය.

2. අංක 1 සහ 3 දරණ වැඩ සඳහා රු. 45,000 හෝ ඊට වැඩි ගණනකටද අංක 2 සඳහා රු. 20,000 කට හෝ ඊට වැඩි ගණනකට ගොඩනැගිලි තැනීම සඳහා අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ හෝ ප්‍රසිඛ වැඩ දෙපාර්තමේන්තුවේ හෝ ලියා පදිංචිව සිටින අයට, අධ්‍යාපන අධ්‍යක්‍ෂකතුමාගේ කාර්යාලයේ (ඒ. සී. ශාඛාව) හෝ කොළඹින් පිට ඕනෑම කච්චේරියක හෝ රු. 100 ක ඇප මුදලක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක් ඉදිරිපත් කරන්නාවූ අයට 1959 මැයි මස 7 වන දින පස්වරු 3.30 වන තෙක් ටෙන්ඩර් පත්‍ර නිකුත් කරණු ලැබේ. චැක්පත්, මනිඕඩර්, පෝස්ටල් ඕඩර් යනාදිය භාරගනු නොලැබේ.

3. ටෙන්ඩර් මුදල් තැන්පත් කිරීම සඳහා අවශ්‍ය මුදල් ගෙවීමේ පත්‍ර කුරුණෑගල, වයඹ පලාතේ අධ්‍යාපන නිලධාරිතුමාගෙන් හෝ

